# කුඩා අමාත්‍ය මණ්ඩලයක් සහිතව මාර්ක් කාර්නි කැනඩාවේ නව අගමැතිවරයා වශයෙන් දිවුරුම් දෙයි.



කැනඩා මහ බැංකුවේ හිටපු අධිපති මාර්ක් කාර්නි දැන් කැනඩාවේ නව අගමැතිවරයා ලෙස නොබෝදා පත්විය. ඒ සමඟම සාමාජිකයින් 24 දෙනෙකුගෙන් යුත් කැබිනට් මණ්ඩලයක් ඔහු විසින් පත්කරගත්තේය. එකී කැබිනට් මණ්ඩලයේ අධිකරණ ඇමතිවරයා වන්නේ ශ්‍රී ලාංකික සම්භවයක් සහිත ගැරී ආනන්දසංගරී මහතාය.

අගමැතිවරයා වශයෙන් පත්වීමට නොබෝ දිනකට පෙර ඔටාවාහිදී ලිබරල් පක්ෂයේ නායකයා තේරීමේ නිලවරණයේදී කාර්නි අන් සියලු තරඟකරුවන් අබිබවා ජයග්‍රහණය ලැබීමට සමත් වූයේ දේශපාලන විචාරකයින්ගේ පුරෝකථන බොරු බවට පත්කරමිනි. කාර්නිගේ පත්වීමත් සමගම වසර නවයකට වැඩි කාලයක් අගමැති ධුරය හෙබවූ ඔහුගේ පූර්වගාමියා වූ ජස්ටින් ට්‍රෑඩෝ සිය ධුරයෙන් ඉල්ලා අස්විය.

නව අගමැතිවරයාගේ කැබිනට් මණ්ඩලය හුරුපුරුදු කිහිප දෙනෙකුගෙන් සමන්විත වන අතරම, 37 දෙනෙකු වූ පැරණි කැබිනට් මණ්ඩලය 24 දෙනෙකුට සීමාකර ඇත.



කැබිනට් මණ්ඩලයට අලුතින් සාමාජිකයින් තිදෙනෙකු පමණක් එක්වී ඇත, රජයේ මන්ත්‍රී මණ්ඩල නායිකාව ලෙස ඇරියෙල් කයාබාගා (Arielle Kayabag), කෘෂිකර්ම අමාත්‍ය ලෙස කෝඩි බ්ලොයිස් (Kody Blois)සහ මහජන සේවා සහ ප්‍රසම්පාදන අමාත්‍ය ලෙස අලි එහ්සාසි(Ali Ehsassi ). කැබිනට් මණ්ඩලයට කාන්තාවන් එකොළොස් දෙනෙකු නම් කරන ලද අතර, ට්‍රෑඩෝ යටතේ පැවතුණු 50-50 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට වඩා අඩු කාන්තාවන් ප්‍රමාණයක් නව කැබිනට් මණ්ඩලය නියෝජනය කරයි.

"කැනඩාවේ නව රජය කැනේඩියානුවන්ට වැදගත් වන දේ කෙරෙහි පමණක් අවධානය යොමු කරනු ඇත." යනුවෙන් පවසමින් නව අගමැතිවරයා අමාත්‍යවරුන් පත්කිරීමේ ශාලාවට ඇතුළු විය.

ජනාධිපති ට්‍රම්ප්ගේ තීරුබදු වලින් කැනේඩියානු කම්කරුවන් ආරක්ෂා කිරීමට තම රජය කටයුතු කරන බවත්, "ඩියානුවන්ගේ සාක්කුවලට වැඩිපුර මුදල් ලැබෙන්නට සලස්වන බවත්, කැනඩාවේ ආර්ථිකය වර්ධනය කිරීමට අවශ්‍ය බවත් ඔහු පැවසීය. "වියදම් කර වැඩිපුර ආයෝජනය කරන්න"තේමාව යටතේ කටයුතු කළ යුතුයයි පැවසූ ඔහු මිත්‍ර රටවල් අතර වෙළඳ කොරිඩෝවක් ගොඩනැගීමට ප්‍රමුඛත්වය දීමට කටයුතු කරන බවත් ඔහු පැවසීය.

"බිනට් මණ්ඩලයේ සංඛ්‍යාව කුඩා වන්නේ මෙය අර්බුදයේ මොහොතක් වන බැවිනි... එය කුඩා කැබිනට් මණ්ඩලයක් වුවත් සියලුඇමතිවරු ජ්‍යෙෂ්ඨයෝ වෙති. ඔවුන් සියල්ලෝම ඉදිරි පෙළේ සිටිති,"පැවසීය.

විදේශ කටයුතු අමාත්‍ය මෙලනි ජොලි, මහජන ආරක්ෂක අමාත්‍ය ඩේවිඩ් මැක්ගින්ටි, ස්වාභාවික සම්පත් අමාත්‍ය ජොනතන් විල්කින්සන් සහ ආරක්ෂක අමාත්‍ය බිල් බ්ලෙයාර් දැරූ තනතුරු වෙනස් වී නොමැත.

ෆ්‍රැන්කොයිස්-පිලිප් ෂැම්පේන් දැන් මුදල් අමාත්‍යවරිය වන අතර කලින් ප්‍රවාහන අමාත්‍යවරිය ලෙස කටයුතු කළ ඇනීටා ආනන්ද් කර්මාන්ත අමාත්‍ය ධුරයට පත් කරනු ලැබේ.

ඩොමිනික් ලෙබ්ලාන්ක් මුදල් අමාත්‍ය තනතුරෙන් ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍ය තනතුරට පත්කර තිබේ. ඇය අන්තර් රාජ්‍ය කටයුතු අමාත්‍යවරිය ද වේ.

නායකත්වයේ දෙවන ස්ථානයට පත්වූ හිටපු නියෝජ්‍ය අගමැති සහ මුදල් අමාත්‍ය ක්‍රිස්ටියා ෆ්‍රීලන්ඩ් ප්‍රවාහන අමාත්‍යවරිය ලෙස දිවුරුම් දුන්නාය.

නීතිපති අරිෆ් විරානි ඊළඟ ෆෙඩරල් මැතිවරණයේදී නැවත ඉදිරිපත් නොවන බව පැවසීමත් සමග, අගමැතිවරයා විසින් ගැරී ආනන්දසංගරී අධිකරණ හා නීතිපති අමාත්‍ය ධුරයට පත් කරන ලද අතර, ස්වදේශීය සබඳතා සහ උතුරු කටයුතු අමාත්‍ය ධුරයේ ද රැඳී සිටිනු ඇත.

ට්‍රෑඩෝ ඇතුළු හිටපු අමාත්‍යවරුන් අට දෙනෙකු ඉදිරි ෆෙඩරල් මැතිවරණයට ඉදිරිපත් නොවන බව නිවේදනය කර ඇත.

නමුත් කානි විසින් හිටපු ආගමන අමාත්‍ය මාර්ක් මිලර්, රාජ්‍ය සේවා සහ ප්‍රසම්පාදන අමාත්‍ය ජීන්-යෙව්ස් ඩක්ලොස්, රජයේ මන්ත්‍රී මණ්ඩල නායිකා කරීනා ගෝල්ඩ් සහ ධීවර අමාත්‍ය ඩයෑන් ලෙබූතිලියර් ඇතුළු ප්‍රවීණ අමාත්‍යවරුන් කිහිප දෙනෙකු ද තම අමාත්‍ය මණ්ඩලයෙන් ඉවත් කර ඇත.

### මාර්ක් කානි අගමැතිවරයා යටතේ පත්වූ සම්පූර්ණ අමාත්‍ය මණ්ඩලය මෙසේය.

- **Mark Carney** - Prime Minister
- **Dominic LeBlanc** - Minister of International Trade and Intergovernmental Affairs and President of the King's Privy Council for Canada
- **Mélanie Joly** - Minister of Foreign Affairs and International Development
- **François-Philippe Champagne** - Minister of Finance
- **Anita Anand** - Minister of Innovation, Science and Industry
- **Bill Blair** - Minister of National Defence
- **Patty Hajdu** - Minister of Indigenous Services
- **Jonathan Wilkinson** - Minister of Energy and Natural Resources
- **Ginette Petitpas Taylor** - President of the Treasury Board
- **Steven Guilbeault** - Minister of Canadian Culture and Identity, Parks Canada and Quebec Lieutenant
- **Chrystia Freeland** - Minister of Transport and Internal Trade
- **Kamal Khera** - Minister of Health
- **Gary Anandasangaree** - Minister of Justice and Attorney General of Canada and Minister of Crown-Indigenous Relations and Northern Affairs
- **Rechie Valdez** - Chief Government Whip
- **Steven MacKinnon** - Minister of Jobs and Families
- **David J. McGuinty** - Minister of Public Safety and Emergency Preparedness
- **Terry Duguid** - Minister of Environment and Climate Change
- **Nate Erskine-Smith** - Minister of Housing, Infrastructure and Communities
- **Rachel Bendayan**, Minister of Immigration, Refugees and Citizenship
- **Élisabeth Brière** - Minister of Veterans Affairs and Minister responsible for the Canada Revenue Agency
- **Joanne Thompson** - Minister of Fisheries, Oceans and the Canadian Coast Guard
- **Arielle Kayabaga** - Leader of the Government in the House of Commons and Minister of Democratic Institutions
- **Kody Blois** - Minister of Agriculture and Agri-Food and Rural Economic Development
- **Ali Ehsassi** - Minister of Government Transformation, Public Services and Procurement